00029

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - **2019/2020**

EPC1332/ESC1132 - පෙර පාසල් අධ්‍යාපන මූලධර්ම

කාලය - පැය දෙකයි. **(02)**

දිනය - 2023.06.11 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30 දක්වා

---

1 වන කොටසේ **සියළුම ප්‍රශ්නවලට** ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද **(03)** පිළිතුරු සපයන්න.

පළමු වන කොටස

01. පෙරපාසල් අධ්‍යාපනය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

02. "ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය" යන යෙදුම කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ අරමුණු **පහක් (05)** ලියන්න.

04. ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයට සම්බන්ධ ගැටලු **පහක් (05)** ලැයිස්තු ගත කරන්න.

05. "සහභාගිත්වය සඳහා ඇති අයිතිය" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

06. 'කින්ඩර්ගාර්ටන් ' යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

07. චීනයේ පෙරපාසල් අධ්‍යාපනයේ අරමුණු **පහක් (05)** ලැයිස්තු ගත කරන්න.

08. ශ්‍රී ලංකාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාර්යයන් **පහක් (05)** සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

දෙවන කොටස

09. (i) පරමාර්ථ සහ අරමුණු අතර වෙනස දක්වන්න. (ලකුණු 08)

(ii) පෙර පාසල් අධ්‍යාපනය තුළින් ලභාකර ගැනීමට අපේක්ෂිත අරමුණක් ලියන්න. ඔබ විසින් ලියන ලද එම අරමුණ ඉටුකර ගැනීමට සුදුසු ක්‍රියාකාරකමක් තෝරා ගන්න. එම ක්‍රියාකාරකම ඔබ විසින් දක්වන ලද අරමුණ ඉටුකර ගැනීමට හැකි අයුරින් සංවිධානය කර ක්‍රියාත්මක කරන අයුරු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. (i) ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ ඓතිහාසික පසුබිම විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ පෙර පාසල් ගුරුවරුන්ට වෘත්තීය අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා දීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. (i) "පෙරපාසල් ගුරුවරිය පෙරපාසල් දරුවන්ට දෙවෙනි මවක් විය යුතුය."

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් ගුරුවරියකගේ ප්‍රධාන භූමිකා **පහක් (05)** උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) "ගුරුවරියක විසින් පාඩම් සැලසුම් සැකසීමේ දී අරමුණු ඉතා වැදගත් වේ."

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 07)

(ii) සෞන්දර්යාත්මක/මනෝචාලක සංවර්ධනය යන පරමාර්ථය යටතේ එන අරමුණු **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) ඉහත සඳහන් කළ අරමුණු අතරින් එක් අරමුණක් තෝරා ගන්න. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරකමක් සංවිධානය කර ක්‍රියාත්මක කරන ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. පහත සඳහන් මාතෘකා **දෙකක් (02)** සඳහා කෙටි සටහන් ලියන්න.

i. යුධමය පරිසරවල ජීවත්වන ළමුන්

ii. දිවා සුරැකුම් මධ්‍යස්ථාන

iii. ළමා සංවර්ධනය පිළිබඳ ප්ලේටෝගේ අදහස්

iv. ළමයාගේ උපරිම අභිවෘද්ධිය සඳහා වන මූලධර්මය (ලකුණු 10 x 02 = 20)

භිමිකම් ඇවිරිණි.